ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන 2022/23

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2023

SNU5239/ESU3139 - අධ්‍යාපනයේ නව ප්‍රවණතා

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.10.29 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ නව ගෝලීය ප්‍රවණතා පහක් (05) සඳහන් කරන්න.

02. ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමකාලීන ගැටලු සඳහා උදාහරණ දෙකක් (02) සඳහන් කරන්න.

03. දුබලතා සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන පනතෙහි මූලධර්ම හයක් (06) ලැයිස්තුගත කරන්න.

04. අන්තර්කරණ අධ්‍යාපනයේ දී සමූහ ප්‍රවේශය (Team approach) යනු කුමක්දැයි උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

05. අන්තර්කරණ අධ්‍යාපන ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගත හැකි ආයතනික උපාය මාර්ග පහක් (05) ලැයිස්තු ගත කරන්න.

06. නොවිධිමත් අධ්‍යාපනය තුළින් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සවිබල ගන්වන ආකාරය පිළිබඳ කරුණු පහක් (05) ඉදිරිපත් කරන්න.

07. ශ්‍රී ලංකාව තුළ ඒකීකරණ හා අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක වුව ද, විශේෂ පාසල්වල භාවිතයේ අවශ්‍යතාවය උදාහරණ සහිත ව විස්තර කරන්න.

08. ඒකීකරණ අධ්‍යාපන ක්‍රමයේ අවධි හතර (04) පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) කාන්තාවන්ට එරෙහිව සෑම අන්දමේ විභේදනයන් තුරන් කිරීම පිළිබඳ සම්මුතියේ මූලධර්ම සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) දුබලතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ අභිමානය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ දුබලතාව පිළිබඳ ගෝලීය වැඩසටහන ක්‍රියා කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ජාත්‍යන්තර සහ ජාතික සම්මුතීන් මගින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය කෙතරම් දුරට සහතික කෙරේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 09)

10. (i) අධ්‍යාපනය පිළිබඳ ලිබරල්වාදීන්ගේ පර්යාලෝක පිළිබඳ උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) 'සමාජ සංචලනය සඳහා වන අධ්‍යාපනය පුද්ගල සංවර්ධනය සඳහා වන අධ්‍යාපනයේ කාර්යයන්නහි වඩාත් වැදගත් පියවරකි.'

ඉහත සඳහන් ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ සමාජ සාධාරණත්වය සඳහා අධ්‍යාපනය ලැබීමේ දී දුබලතා සහිත දරුවන් මුහුණ දෙන අභියෝග මොනවා ද? (ලකුණු 09)

11. "මුළු ජීවිත කාලය තුළ ඉගෙනීම සිදුවන පරිදි, අධ්‍යාපනය විවිධ සන්දර්භයන් තුළ සිදු වේ."

(i) මනුෂ්‍ය ජීවිතයේ මුළු ජීවිත කාලය තුළ ම සිදුවන අධ්‍යාපන වර්ග තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා නොවිධිමත් සහ අවිධිමත් අධ්‍යාපන ක්‍රමයක ඇති වැදගත්කම උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) මාර්ගගත ඉගෙනීම වත්මන් අධ්‍යාපන ක්‍රමය තුළ නව ප්‍රවණතාවයකි. විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමුන් මාර්ගගත ඉගෙනුම භාවිතයේ දී මුහුණ දෙන අභියෝග මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සහ එහි විකාශන ඉතිහාසයෙහි 'වෙන්කළ අවධිය' සහ 'ආරක්ෂා කිරීමේ අවධිය' යන අවධි දෙක (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ විශේෂ අධ්‍යාපන ඒකක ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපන ක්‍රමය වැඩිදියුණු කිරීමට විශේෂ ඒකකයක, විශේෂ ගුරුවරයා සහාය දෙන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. (i) ශ්‍රී ලංකාවේ දුබලතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට ජාත්‍යන්තර ප්‍රකාශන සහාය දක්වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ අනාගත අධ්‍යාපනය නංවාලීමට අපට පියවර ගත හැකි ආකාරය උදාහරණ සමඟින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය දුබලතා සහිත දරුවන්ගේ අධ්‍යාපනයට සහ සංවර්ධනයට බලපාන ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 09)

14. (i) 'විශේෂ තත්ත්ව යටතේ ස්ථානගතකළ දරුවන්' යන යෙදුම පැහැදිලි කර විශේෂ තත්ත්ව යටතේ ස්ථාන ගත කරන ලද ළමුන් වර්ග පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 06)

(ii) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC) ආබාධ සහිත දරුවෙකුගේ අයිතිවාසිකම් නිරූපණය කරන ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ දුබලතා සහිත දරුවන් තම අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුම, අවබෝධය සහ සේවාවන් ලබා ගැනීමේ දී මුහුණ දෙන අභියෝග මොනවා ද? (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.